GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2014/09/17

## මාධ්‍ය නිවේදනයයි

පානදුර කේතුමති කාන්තා රෝහල ප්‍රදේශයේ ජනතාවට කාලයක් තිස්සේ ඉමහත් සේවයක් සැලසූ සෞඛ්‍ය ආයතනයකි. නමුත් මෑතක සිට මෙම රෝහලේ රෝගී සත්කාරක සේවාවන් බිඳ වැටෙමින් පවතී. මෙයට ප්‍රධානතම හේතුව වී ඇත්තේ මෙම රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරිය බව හෙලිදරව් වී ඇත. ඇය මෙම තනතුරට පත් වී ඇත්තේද අවිධිමත් ආකාරයෙනි.

රෝහලේ සේවය කරන විවිධ වෘත්තීන් අතර හිතා මතා බේද ඇති කිරීම නිසා සූතිකාගාර සේවාවන් ප්‍රමුඛ සියලු සේවාවන් අර්බුදයකට පත්ව ඇත. තමන්ට හිතවත් කිහිප දෙනෙකුගෙන් යුත් කල්ලියකගේ උපදෙස් පරිදි ක්‍රියා කරන මෙම නිලධාරිනිය විසින් විශේෂඥ වෛද්‍යවරුන්ගේ උපදෙස් පවා බැහැර කරමින් ගෙන යන අත්තනෝමතික පාලනය රෝගී සත්කාර සේවා වල බිඳ වැටීමට සෘජුවම බලපා ඇත.

රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ පානදුර ශාඛාව කිහිපවිටක්ම අදාල නිලධාරිනිය සමග සාකච්ඡා මාර්ගයෙන් මෙම ගැටලුව විසඳා ගැනීමට උත්සාහ කලත් ඒ සියලු උත්සාහයන් අසාර්ථක වී ඇත. මේ පිළිබඳව රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ මධ්‍යම කාරක සභාවේ සහ විධායක සභාවේද අවධානය යොමු වී ඇත. උද්ගත වී ඇති තත්ත්වය සැලකිල්ලට ගනිමින් දින 14ක් ඇතුලත මෙම නියෝජ්‍ය වෛද්‍ය අධිකාරීවරිය වෙනත් ආයතනයකට මාරු කර යැවීමට, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජනරාල්වරයා පසුගිය අගෝස්තු 28 වනදා පොරොන්දු විය. එහෙත් තවමත් එම ගැටලුව විසඳී නොමැති බැවින් සැප්තැම්බර් 23 අඟහරුවාදා, පානදුර මූලික රෝහලේ සහ කේතුමති කාන්තා රෝහලේ වැඩ වර්ජනයක් දියත් කිරීමට රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ පානදුර ශාඛාව අද දින පැවති රැස්වීමකදී තීරණය කර ඇත.

ස්තුතියි,

වෛද්‍ය ලසන්ත පිනදාස
ලේකම්

වැඩිදුර විස්තර සඳහා : වෛද්‍ය චන්දන ධර්මරත්න - 0777750366
වෛද්‍ය නලින්ද හේරත් - 0717876516